24-07-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙම ඉගෙනුම තුළින්, සාම දේශය හරහා, ඔබගේ සතුටේ දේශයට යයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය මෙයයි. ඔබ මෙය කිසිම විටෙක අමතක නොකළ යුතුයි.

**ප්‍රශ්නය:** මෙකල ඔය දරුවන්, නොබැඳි නිරීක්ෂකයෙකු ලෙසින් නරඹන්නේ නාටකයේ කුමන ජවනිකාද?

**පිළිතුර:** මෙකල, නාටකයේ සම්පූර්ණ දුක් ජවනිකා තිබේ. කෙනෙකුට යම් සතුටක් තිබුණත්, එය කපුටෙකුගේ අසූචි මෙන් තාවකාලිකයි. ඉතිරිය, දුක හැර වෙනත් දෙයක් නොවෙයි. ඔය දරුවන් දැන් ආලෝකයට පැමිණ ඇත. අසීමිත ලෝක චක්‍රය, තත්පරයෙන් තත්පරයට බ්‍රමණය වන ආකාරය ගැන ඔබ දන්නවා. එක දවසක් ඊළඟ දවසට සමාන විය නොහැක. නව ජවනිකා දිගින් දිගටම පැවතෙන අතර, මුළු ලෝකයේම රංගනය දිගින් දිගටම වෙනස් වෙනවා.

ඕම් ශාන්ති. දෙගුණයක් ඕම් ශාන්ති. පියා, ඔහුගේ ආදිතම ධර්මයේ ස්ථාවර වී ඇති සේම, ඔහු ඔය දරුවන්ටද පවසන්නේ, ඔබගේ ආදිතම ධර්මයේ ස්ථාවර වී, පියාව සිහිපත් කරන ලෙසටයි. වෙනත් කිසිවෙකුට මෙසේ කිව නොහැක ඔබගේ ආදිතම ධර්මයේ ස්ථාවර වන්න. ඔය දරුවන්ගේ බුද්ධියේ විශ්වාසය තිබේ. බුද්ධියේ විශ්වාසය ඇති අය, ජය ලබනවා. ජය ලබන්නේ ඔවුන්ය. ඔවුන් ලබන්නේ කුමන ජයග්‍රහණයක්ද? පියාගේ උරුමයේ. දිව්‍ය ලෝකයට යෑම යනු, පියාගේ උරුමය ලබාගැනීමේ ජය ගැනීමයි. ඔබ සිදුකරන අනෙක් උත්සාහය වන්නේ තත්ත්වයක් ලබා ගැනීමටයි. ඔබ අනිවාර්යෙන්ම දිව්‍ය ලෝකයට යා යුතුයි. මෙය අපිරිසිදු ලෝකයක් බව ඔය දරුවන් දන්නවා. තව බොහෝ දුක පැමිණීමට තිබේ. ලෝක නාටකයේ චක්‍රයද ඔබ දන්නවා. ජීවාත්ම පිවිතුරු කර, ඔවුන්ව මදුරු රැන් සේ ආපසු නිවසට රැගෙන යාමට, බාබා බොහෝ වාර ගණනක් පැමිණ ඇත. ඉන්පසුව ඔහු ගොස් සාම දේශයේ වාසය කරයි. දරුවන්ද එහි යයි. ඔබ මෙම ඉගෙනුම තුළින් සාම දේශය හරහා, ඔබගේ සතුටේ දේශයට යෑම ගැන ඔය දරුවන්ට සතුටක් තිබිය යුතුයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය මෙයයි. ඔබ මෙය අමතක නොකළ යුතුයි. ඔබ සෑම දිනෙකම මෙය අසනවා. පියා ඔබට උගන්වන්නේ ඔබව පාරිශුද්ධත්වයට පත් කිරීමට බව ඔබට වැටහෙනවා. පිවිතුරු වීමට, ඔහු ඔබට සිහිපත් කිරීමේ පහසු මාර්ගය පෙන්වා දෙයි. මෙය අළුත් යමක් නොවෙයි. දෙවියන් රාජයෝගාව ඉගැන්වූ බව ලියැවී ඇත. ඔවුන් කළ එකම වරද වන්නේ ඔවුන් ගීතාවේ ක්‍රිෂ්ණාගේ නම ඇතුලත් කිරීමය. ගීතාව හැර, වෙනත් කිසිම ආගමික ග්‍රන්ථයක, ඔය දරුවන් දැන් ලබන දැනුම නොමැත. පියාට තිබෙන ප්‍රශංසාව කිසිම මනුෂ්‍යයෙකුට නැති බව ඔය දරුවන් දන්නවා. පියා නොපැමිණියේ නම්, ලෝක චක්‍රය බ්‍රමණය වන්නේ නැත. දුක් දේශය, සතුටේ දේශය බවට පත් වන්නේ කෙසේද? ලෝක චක්‍රය බ්‍රමණය විය යුතුයි. එබැවින් පියා, නිසැකයෙන්ම පැමිණිය යුතුයි. පියා සියල්ලන්ව ආපසු නිවහනට රැගෙන යාමටද පැමිණෙන අතර, ඉන්පසුව චක්‍රය නැවතත් ආරම්භ වෙයි. පියා පැමිණියේ නැත්නම්, කලි යුගය, ස්වර්ණමය යුගය බවට පරිවර්ථනය වන්නේ කෙසේද? මෙම දේවල් ග්‍රන්ථ වල සඳහන් කර නැත. රාජයෝගාව ගැන සඳහන් වෙන්නේ ගීතාවේ පමණයි. දෙවියන්, අබූහි පැමිණ ඇති බව, මිනිසුන් දැනගත්තේ නම්, ඔවුන් සියල්ලම ඔහු මුණ ගැසීමට මෙහි දිව එනු ඇත. සන්‍යාසීන්ටද අවශ්‍ය වන්නේ දෙවියන්ව මුණගැසීමටයි. මිනිසුන් පාරිශුද්ධකරුවාව සිහි කරන්නේ, ආපසු නිවසට යමටයි. ඔය දරුවන් දැන් කෝටි ප්‍රකෝටි ගුණයක් භාග්‍යවන්ත වනවා. එහි අසීමිත සතුට තිබේ. නව ලෝකයේ පැවතුණු දේවතා ධර්මය, තව දුරටත් නොපවතී. පියා, බ්‍රහ්මාගේ මාර්ගයෙන්, දේවතා රාජධානියේ ස්ථාපනය සිදුකරයි. මෙය ඉතා පැහැදිලියි. ඔබගේ අරමුණ සහ ඉලක්කය මෙයයි. මෙහි සැකයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. ඔබ තව දුරටත් ප්‍රගතිය කරා යන විට, රාජධානිය අනිවාර්යෙන්ම ස්ථාපිත කළ යුතු බව, ආදි සනාතන දෙවි දේවතා ධර්මය තිබෙන්නට යන බව වැටහෙයි. ඔබ දිව්‍ය ලෝකයේ ජීවත් වන විට, මෙම දේශයට භාරතය යැයි කියන අතර, ඔබ අපායට පැමිණෙන විට, එයට හින්දුස්ථාන් යැයි කියයි. මෙහි ඇත්තේ දුකය, දුකම පමණය. ඉන්පසුව, මෙම ලෝකය, දිව්‍ය ලෝකය බවට පරිවර්ථනය වනවා සතුටේ දේශය පමණක් තිබෙයි. ඔය දරුවන්ට මෙම දැනුම තිබේ. ලෝකයේ මිනිසුන් කිසිම දෙයක් දන්නේ නැත. පියාම පවසන්නේ එය දැන් රාත්‍රියේ අන්ධකාරයයි. මනුෂ්‍යයින්ගේ පය, දිගින් දිගටම රාත්‍රියේ පැටලෙයි. ඔය දරුවන් දැන් සිටින්නේ ආලෝකයේ. නොබැඳි නිරීක්ෂකයන් වී, ඔබගේ බුද්ධියෙන් මෙය ධාරණය කරගන්න. අසීමිත ලෝක චක්‍රය, තත්පරෙන් තත්පරයට බ්‍රමණය වෙයි. එක් දිනක් ඊළඟ දිනය මෙන් විය නොහැක. මුළු

ලෝකයේම රංගනයන්, දිගින් දිගටම වෙනස් වන අතර, නව ජවනිකා දිගටම පැවතෙයි. මෙකල, පූර්ණ දුක් ජවනිකා තිබේ. සතුට තිබේ නම් එය කපුටෙකුගේ අසූචි මෙන් වන අතර, ඉතිරි සියල්ලම දුකම පමණයි. සමහර අයට ඇතැම් විට, මේ උපතේ සතුට තිබෙනවා විය හැකි, නමුත් ඔවුන්ගේ මතු උපතෙදී දුක ඇතිවෙයි. ඔබ දැන් ඔබගේ නිවසට යෑමට ඇති බව, ඔය දරුවන්ගේ බුද්ධියේ තිබේ මේ සඳහා පිවිතුරු වීමට ඔබ උත්සාහ ගත යුතුයි. ඔබට ශ්‍රී ලක්ෂ්මී සහ ශ්‍රී නාරායන් වීමට, ශ්‍රී ශ්‍රී, ඔබට ශ්‍රීමත් ලබා දී ඇත. නීතඥයෙක් ඔබට උපදෙස් දෙන්නේ ඔබට නීතිඥයෙකු වීමටයි. පියා දැන් පවසන්නේ ශ්‍රීමත් අනුගමනය කර මෙය වන්න. තමන්ගෙන් විමසන්න මා තුළ කිසියම් දුර්වලතාවයන් තිබේද? මිනිසුන් දැන් ගායනා කරන්නේ මට ගුණදම් නොමැත! ගුණදම් මාහට නොමැත! මට කරුණාව දක්වන්න! කරුණාව යනු අනුකම්පාවයි. බාබා පවසන්නේ දරුවනි, මට කිසි කෙනෙක් ගැන අනුකම්පාවක් නැත. ඔය සෑම කෙනෙක්ම තමන්ට අනුකම්පා කළ යුතුයි. මෙම නාටකය පෙර නියම වූ එකක්. අනුකම්පා විරහිත රාවණ, ඔබව දුක කරා ගෙන යයි. මෙයත් නාටකයේ නියම වී තිබේ. මෙයට, රාවණ මත වරද පැටවිය යුතු නැත. පියා පැමිණ ඔබට අවවාද දෙනවා පමණයි. ඔහුගේ අනුකම්පාව මෙයයි. කෙසේවෙතත්, මෙම රාවණගේ රාජධානිය තව දුරටත් පැවතෙයි. නාටකය සදාතනිකයි. රාවණ මත මෙන්ම, මනුෂ්‍යයන් මතද වරද පැටවිය යුතු නැත. චක්‍රය භ්‍රමණය විය යුතුයි. තම තමන්ව රාවණගෙන් මුදවාගැනීමට, පියා දිගින් දිගටම ඔබට ක්‍රමවේද පෙන්වා දෙයි. රාවණගේ උපදෙස් පිළිපැදීමෙන් ඔබ බොහෝ පාපකාරී ජීවාත්ම බවට පත් වී සිටියි. මෙය දැන් පැරණි ලෝකයයි. නව ලෝකය අනිවාර්යෙන්ම පැමිණෙයි. චක්‍රය භ්‍රමණය විය යුතුයි. ස්වර්ණමය යුගය, අනිවාර්යෙන්ම නැවත වරක් පැමිණිය යුතුයි. එය දැන් සංගම යුගයයි. මෙය මහා භාරත යුද්ධ සමයයි. විනාශ කාලයේ, සෙනෙහස නොමැති බුද්ධි ඇති අය, විනාශය කරා යයි. මෙය සිදුවෙයි, ඉන්පසුව අපි ජයගෙන, දිව්‍ය ලෝකයේ අධිපතියන් වෙයි. ඉතිරි අයගෙන් කිසිවෙකුත් එහි නොසිටියි. පිවිතුරු නොවී, දේවතාවන් වීමට අපහසු බව ඔබට වැටහෙනවා. ඔබව උසස් දේවතාවන් බවට පත් කිරීම සඳහා, පියා දැන් ඔබට ශ්‍රීමත් ලබා දෙනවා. වෙනත් කිසිම කාලයක ඔබට එවන් උපදෙස් ලබාගත නොහැක. ඔබට ශ්‍රීමත් දීමේ ඔහුගේ චරිත කොටස ඔහු රඟපාන්නේ, සංගම යුගයෙදි පමණයි. මෙම දැනුම වෙනත් කිසිවෙකුට නැත. භක්තිය යනු භක්තියයි එයට දැනුම යැයි කිව නොහැක. ආධ්‍යාත්මික දැනුම ලබා දෙන්නේ, දැනුමේ මහා සයුර වන ජීවයයි. 'දැනුමේ මහා සයුර, සතුටේ මහා සයුර' යන ප්‍රශංසාව, ඔහුගේ පමණයි. පියා ඔබට උත්සාහ දරන ක්‍රම පෙන්වා දෙයි. ඔබ දැන් අසමත් වුණොත්, ඔබ චක්‍රයෙන් චක්‍රයට අසමත් වන බව සහ ඔබ විශාල වශයෙන් පීඩාවට පත් වන බව ඔබගේ අවධානයේ තිබිය යුතුයි. ඔබ පීඩාවට පත් වන්නේ ඔබ ශ්‍රීමත් අනුගමනය නොකරන විටයි. බ්‍රහ්මණ වෘක්ෂය අනිවාර්යෙන්ම වර්ධනය විය යුතුයි. දේවතාවන්ගේ වෘක්ෂය වැඩෙන තරමට පමණයි එය වැඩෙන්නේ. ඔබ උත්සාහ දරා, අන් අයවත් එසේ කිරීමට දිරිමත් කළ යුතුයි. අංකුරය අඛණ්ඩව පැල කෙරෙන අතර, ගස විශාල වෙයි. ඔබට දැන් යහපතක් සිදු කෙරෙන බව ඔබ දන්නවා. ඔබ අපවිත්‍ර ලෝකයෙන්, පිවිතුරු ලෝකයට යෑම, ඔබ අත්දකින යහපතයි. ඔය දරුවන්ගේ බුද්ධියේ අගුල් දැන් විවර වී ඇත. පියා, ප්‍රඥාවන්ත බුද්ධියයි. ඔබට දැන් සෑම දෙයක්ම වැටහෙනවා. ඔබ තව දුරටත් දියුණු වත්ම, බුද්ධියේ අගුල් විවර වන අයව ඔබ දකීවි. මෙයත් නාටකයට අනුව දිගටම සිදුවෙයි. ඉන්පසුව එය ස්වර්ණමය යුගයේ සිට නැවත වරක් ඒ අන්දමින්ම සිදුවෙයි. යුගය ආරම්භ වන්නේ, ලක්ෂ්මී සහ නාරායන්ගේ අභිශේකයේ පටන්ය. වර්ෂ 1 සිට 1250 දක්වා එය දිව්‍ය ලෝකය බව, ඔබ ඉතා පැහිදිලිව ලියයි. සත්‍ය නාරායන්ගේ කතා පුවත ඇත. එමෙන්ම අමරණීයත්වයේ ස්වාමියා ගැන භක්තියේ කතා පුවතද ඇත. ඔබ දැන් අමරණීයත්වයේ ස්වාමියාගේ සත්‍ය කතාවට සවන් දෙමින් සිටිනවා. ඉන්පසුව මෙම සමයේ සිහිවටනය, භක්ති මාර්ගයේදී දිගටම පැවතෙයි. සියලුම උත්සව ආදියෙන් හැඳින්වෙන්නේ මෙම සමය පිළිවඳවයි. අංක එකේ උත්සවය වන්නේ ශිව බාබාගේ පැමිණීම ගැනයි. මුළු ලොවම වෙනස් කිරීම සඳහා පියා අනිවාර්යෙන්ම කලි යුගය අවසානයේදී පැමිණිය යුතුයි. ගිණුම කෙතරම් නිවැරදිද කියා, පිංතූර දෙස හොඳින් බලන කෙනෙකුට දැකිය හැක. ඔබ පෙර චක්‍රයේදී සිදු කළ එම උත්සාහයම අනිවාර්යෙන්ම නැවතත් සිදු කරන බව සහතිකය. ඔබ නොබැඳි නිරීක්ෂයන් වී, අන් අය සිදුකරන උත්සාහයන් දෙස බලයි. ඔවුන්ගේ උත්සාහයන් ගැන ඔවුන් දනී. ඔබද දන්නවා. ඔහු කෙතරම් ඉගෙනගෙන තිබේද කියා, ශිෂ්‍යයෙක් නොදන්නේද? ඔහු යම්කිසි විෂයකින් බොහෝ දුර්වල නම්, ඔහුගේ යටි සිත ඇතුලාන්තයෙන් ඔහුට දොස් නඟයි, එවිට ඔහු ඇද වැටෙනු ඇත. විභාග සමයෙදී, ඔවුන්ගේ ඉගෙනුම් වල දුර්වල අයගේ හදවත්, බොහෝ වේගයෙන් ස්පන්දනය වෙයි. දරුවන්ට දර්ශන ලැබෙයි, නමුත් ඔවුන් ඒ වනවිටත් අසමත්වී සිටියි. එබැවින් ඒ වෙලාවෙදී කුමක් කරන්නද? කෙනෙක් පාසැලේදී අසමත් වන විට, නෑදෑයින් සහ ගුරුවරයා කලබල වෙනවා. එම පාසැලෙන් ඉතා සුළු පිරිසක් පමණක් සමත් වන්නේ නම්, ගුරුවරයා හොඳ මදි නිසා එය සමහර විට සිදුවන්නට ඇති බව ඔවුන් කියයි. මධ්‍යස්ථාන වල හොඳ ගුරුවරුන්

කවුරුන්ද, එමෙන්ම ඔවුන් උගන්වන්නේ කෙසේද කියා බාබා දන්නවා. අන් අයට හොඳින් උගන්වා ඔවුන්ව මෙහි කැඳවාගෙන එන්නේ කවුරුන්ද කියා ඔහු දන්නවා. ඔහු සෑම දෙයක්ම දන්නවා. බාබා පවසන්නේ මෙහි වළාකුළු රැගෙන එන්න. ඔබ ඔබගේ කුඩා දරුවන් මෙහි රැගෙන එන්නේ නම්, ඔබට ඔවුන් කෙරෙහි බැඳීම් තිබේ. ඔබගේ බුද්ධිය මේ මත යොමු කර තබා ගැනීම සඳහා, ඔබ තනිව පැමිණිය යුතුයි. ඔබ කොහොමත් නිවසෙදී සෑම විටෙකම ඔබගේ දරුවන් දකිනවා. පියා පවසන්නේ මෙම පැරණි ලෝකය සොහොන් බිමක් වීමට තිබේ. අළුත් නිවසක් ගොඩනැගෙන විට, ඔබගේ අළුත් නිවස ගොඩනැඟෙන බව ඔබගේ බුද්ධියේ රැඳී තිබේ. ඔබගේ ව්‍යාපාරික කටයුතු වල ඔබ කොහොමත් නියැලෙන නමුත්, ඔබගේ බුද්ධිය නව නිවසට ඇදී යයි. ඔබ නිකම්ම කොහේ හෝ ස්ථානයක සන්සුන්ව අසුන් ගෙන සිටින්නේ නැත. එය සීමිත කාරණාවක් වන අතර, මෙය අසීමිත කරුණකි. සෑම ක්‍රියාවක්ම කරන අතර, ඔබ දැන් ආපසු නිවසට යාමට ඇති බවත්, ඉන්පසුව ඔබ ඔබගේ රාජධානියට ගොස් අසීමිත සතුට අත්විඳින බවත්, ඔබගේ අවධානයේ තබාගන්න. පියා පවසන්නේ දරුවනි, ඔබ ඔබගේ දරුවන් ආදිය රැක බලාගත යුතු නමුත්, බුද්ධිය එහි ඉහළට සම්බන්ධ වී තිබිය යුතුයි. ඔබ සිහිපත් කිරීමේ සිටින්නේ නැත්නම්, ඔබට පිවිතුරු විය නොහැක. සිහිපත් කිරීමේ සිටීමෙන් ඔබ පිවිතුරු වන අතර, දැනුම තිබීමෙන් ඔබ ආදායමක් උපයාගනී. මෙහි සෑම කෙනෙක්ම අපවිත්‍රයි. ඉවුරු දෙකකි. බාබාට තොටියා යැයි කියන නමුත් කිසිවෙක් එහි අරුත වටහාගන්නේ නැත. පියා ඔබව එගොඩට, එහා ඉවුරට රැගෙන යන බව ඔබ දන්නවා. පියාව සිහි කිරීමෙන් ඔබ ඉතා සමීප වන බව, ඔය ජීවාත්ම දන්නවා. දී තිබෙන 'තොටියා' යන නාමෙහි වැදගත්කමක් තිබේ. සෑම කෙනෙක්ම මෙම ප්‍රශංසාව ගායනා කරයි මගේ ඔරුව එගොඩ කරන්න. ඔබ ස්වර්ණමය යුගයේදී මෙය ගායනා කරයිද? මිනිසුන් කන්නලව් කරන්නේ කලි යුගයෙදි පමණයි. ඔය දරුවන්ට මේ සෑම දෙයක්ම වැටහෙනවා. නුවණ නොමැති අයට මෙහි පැමිණිය නොහැක. බාබා එය තදින්ම තහනම් කරනවා. කෙනෙකුට විශ්වාසය නොමැති නම්, ඔබ ඔහුව කොහෙත්ම මෙහි රැගෙන නො ආ යුතුයි ඔහුට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. පළමුවෙන්ම ඔහුට දින හතේ පාඨමාලාව ලබා දෙන්න. දින දෙකකින් පමණක් වුවද, කෙනෙකුට ඊතලය පසාරු විය හැක. ඔහු එයට කැමති නම් ඔහු එය අත්නොහරියි. ඔහු මෙසේ කියනු ඇත, 'මට තව දින හතක් මෙය හැදෑරීමට අවශ්‍යයි.' එම ජීවාත්මය මෙම වංශයට අයත් බව, එවිට සැනෙකින් ඔබට වැටහෙයි. තියුණු බුද්ධි ඇති අය, වෙනත් දේවල් ගැන සැලකිලිමත් වන්නේ නැත. 'හොඳයි, මගේ රැකියාවෙන් මාව ඉවතට දැමුවහොත්, මා වෙනින් එකක් සොයා ගන්නවා.' අවංක හදවත් ඇති දරුවන්ව කිසිම විටෙක තම රැකියා වලින් ඉවත් කරන්නේ නැත ඔවුන්ම පුදුම වෙනවා. ඇතැම් දරුවන් පවසන්නේ 'බාබා, මගේ සැමියාගේ බුද්ධිය පරිවර්ථනය කරන්න!' බාබා පවසන්නේ මට එය කරන්නට කියා නොකියන්න! ඔබට සිහිපත් කිරීමේ සිට, ඔහු සමඟ අසුන්ගෙන, යෝගා බලයෙන් මෙම දැනුම විස්තර කළ හැක. බාබා කිසිම කෙනෙකුගේ බුද්ධිය පරිවර්ථනය කරන්නේ නැහැ. එසේ නම් සෑම කෙනෙක්ම එයම කරයි. එක පුද්ගලයෙක් කිරීමට ආරම්භ කරන ක්‍රමවේදයක්, ඉතා විගසින් මිනිසුන් අනුගමනය කිරීමට පටන් ගනී. ගුරු කෙනෙකුගෙන් කෙනෙකුට යහපතක් ලැබුණු බව අන් අයට ඇසුණු විට, ඔවුන් සියලු දෙනාම එම කෙනාව අනුගමනය කිරීමට පටන් ගන්නවා. ඉහළ සිට පැමිණෙන නව ජීවාත්මයක් ගැන ඇත්ත වශයෙන්ම වර්ණනාවක් තිබෙයි. එවිට ඔහුට අනුගාමිකයන් බොහෝ දෙනෙක් සිටියි. මේ නිසයි, ඔබ ඒ කිසිම දෙයක් දෙස නොබැලිය යුත්තේ. ඔබ තමන් දෙස පමණක් බලා ඔබ කෙතරම් දුරට ඉගෙන ගන්නවාද කියා බැලිය යුතුයි. බාබා ඔබත් සමඟ විස්තරාත්මකව කතාබහ කරයි. ඔබ ඔවුන්ට 'පියාව සිහිපත් කරන්න' කියා පමණක් කියන්නේ නම්, එය නිවසේ අසුන් ගෙන සිට වුවත් කළ හැක. කෙසේවෙතත්, දැනුමේ මහා සයුර අනිවාර්යෙන්ම දැනුම ලබා දෙයි, එසේ නොවේද? ප්‍රධානතම දේ වන්නේ 'මන්මනභවයි.' මේ සමඟම ඔහු ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ රහස්ද විස්තර කරදෙයි. දැන් බොහෝ හොඳ පිංතූර නිර්මාණය කර තිබේ. පියා, ඒවායේ අරුත් ඔබට විස්තර කර දෙයි. විෂ්ණුගේ පෙකණි වැල අග, බ්‍රහ්මාව පෙන්වා ඇත. ත්‍රිමූර්තියද පෙන්වා ඇත. එබැවින් ඔවුන් පෙන්වා ඇති පරිදි, බ්‍රහ්මා, විෂ්ණුගේ පෙකණි වැල අගින් මතු වන්නේ කෙසේද? පියා මෙතැන අසුන් ගෙන, වැරදි දේ සහ නිවැරදි දේ කුමක්ද කියා විස්තර කරයි. මිනිසුන් ඔවුන්ගේම මනඃකල්පිත අදහස් අනුව බොහෝ පිංතූර නිර්මාණය කරයි. ඇතැම් ග්‍රන්ථ වල චක්‍රයද පෙන්වා ඇති අතර, එහි කාල පරාසය එකක එක් දෙයක් වශයෙන්ද තවත් එකක වෙනත් දෙයක් වශයෙන්ද ලියා ඇත බොහෝ මත තිබේ. ග්‍රන්ථ වල බොහෝ සීමිත දේවල් ලියා තිබේ. මුළු ලෝකයම රාවණගේ රාජධානිය වන අන්දම ගැන, පියා අසීමිත දේවල් විස්තර කරයි. ඔබ අපවිත්‍ර වූයේ කෙසේද එමෙන්ම ඔබට නැවත වරක් පිවිතුරු විය හැක්කේ කෙසේද යන දැනුම, ඔබගේ බුද්ධියේ තිබේ. අන් සියලුම ආගම් පැමිණෙන්නේ පසුවයි. බොහෝ විවිධත්වයක් තිබේ. එකක් තව එකකට සමාන විය නොහැක. මනුෂ්‍යයින් දෙදෙනෙකුට එකම මුහුණුවර තිබිය නොහැක. මෙම නාටකය පෙර නියම වූවක් වන අතර, එය

අඛණ්ඩව නැවත නැවතත් සිදුවෙයි. පියා මෙතැන අසුන්ගෙන ඔය දරුවන්ට විස්තර කරයි. ඉතිරිව ඇති කාලය, දැන් තව තවත් කෙටියි. තමන්ව පරීක්ෂා කර බලන්න මා කොතෙක් දුරට සතුටින් රැඳී සිටිනවාද? මා කිසිම පාපකාරී ක්‍රියාවක් සිදු නොකළ යුතුයි. අනිවාර්යෙන්ම කුණාටු පැමිණෙයි. පියා විස්තර කරන්නේ දරුවනි, අභ්‍යන්තර ගත වී ඔබගේ වාර්තාව පවත්වාගෙන යන්න, එවිට ඔබ සිදු කර ඇති වැරදි වලට, ඔබට පසුතැවිලි වන්නට හැකි වෙයි. මෙය යෝගා බලයෙන් තමන්ට සමාව දීම වැනිය. බාබා, සමාව ආදිය දෙන්නේ නැත. 'සමාව දීම' යන වචනය, නාටකයේ නැත ඔබ තමන් වෙනුවෙන් උත්සාහ දැරිය යුතුයි. ඔවුන් සිදුකරන පාපයන් වලට, මනුෂ්‍යායින්ම විඳවිය යුතුයි සමාව දීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. පියා පවසන්නේ සෑම අන්දමකින්ම උත්සාහ දරන්න. පියා මෙතැන අසුන් ගෙන මෙය කිරීමට ඔය ජීවයන්ට ක්‍රමවේද ලබා දෙයි. රාවණගේ පැරණි ලෝකයට පැමිණෙන්නට කියා ඔබ පියාට අඬගසයි අපවිත්‍ර අපව, පැමිණ පිවිතුරු කරන්න! කෙසේවෙතත්, මනුෂ්‍යායින්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. එය රකුසු සමාජයයි. දේවතා සමාජය බවට පත් වන, බ්‍රහ්මණ සමාජය ඔබයි. ඔය දරුවන්, අංක පිළිවෙලට උත්සාහ දරනවා. ඉන්පසුව ඔබගේ භාග්‍යයේ තිබෙන්නේ මේ ප්‍රමාණය පමණක් බව කියයි! ඔබ ඔබගේ කාලය අපතේ හරියි. උපතින් උපතට, චක්‍රයෙන් චක්‍රයට, ඔබට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වෙයි. දැන් රැස් කරන කාලය බැවින්, ඔබ තමන්ට පාඩුවක් සිදුනොකළ යුතුයි. පසුව, ඔබ පාඩු අත්විඳියි. රාවණගේ රාජධානියේ බොහෝ පාඩු සිදුවෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අභ්‍යන්තර ගතවී තමන්ව පරීක්ෂා කර බලන්න. ඔබ සිදුකර ඇති වැරදි වලට, ඔබගේ හදවතේ ගැඹුරින්ම පසුතැවිලි වී, යෝගා බලයෙන් තමන්ට සමාව දෙන්න. තමන් වෙනුවෙන් උත්සාහ දරන්න.
2. පියාගේ අවවාද සම්පූර්ණයෙන්ම අනුගමනය කර, තමන්ට අනුකම්පා කරන්න. තමන්ගේ සහ අන් අයගේ උත්සාහයන් දෙස, නොබැඳි නිරීක්ෂකයෙක් ලෙස බලන්න. කිසිම විටෙක තමන්ට පාඩුවක් සිදු කර නොගන්න.

**වරදානය:** ඔබ සැබවින්ම දයාවෙන් පිරිපුන් වී, ලෝකයට සෙත සැලසීමේ හැඟීම් ඇතිව, සෑම ජීවාත්මයකගේම ආරක්ෂාව වෙනුවෙන් සැලසුම් සාදත්වා.

වර්ථමානයේ බොහෝ ජීවාත්ම, තමන්ටම හානි සිදු කිරීමට උපකරණ වෙමින් සිටියි. ඔවුන් වෙනුවෙන් දයාවෙන් පිරිපුන් වී, යම් සැලසුම් සාදන්න. ඔබ ඇතැම් ජීවාත්මයන්ගේ චරිත කොටස් දුටු විට, කලබල නොවන්න, ඒ වෙනුවට ඔවුන්ගේ ආරක්ෂාවට ක්‍රමයක් ගැන සිතන්න. මෙය සෑම විටම සිදුවන බව හෝ ගස වංචල විය යුතු බව නොසිතන්න; නැහැ. පැමිණ ඇති බාධක අවසන් කරන්න. ලොවට සෙත සලසන්නෙක් සහ බාධක විනාශ කරන්නෙක් යන ඔබගේ නම්බු නාම වලට අනුව, ඔබගේ සිතිවිලි, වචන සහ ක්‍රියා තුලින් දයාවන්ත වී, වාතාවරණය වෙනස් කිරීමට සහයෝගය ලබා දෙන්න.

**පාඨය:** කර්ම යෝගීවරු වීමට හැකි වන්නේ, ඔවුන්ගේ බුද්ධිය මත අවධානයේ ආරක්ෂකයාව තබා ගන්න අයට පමණයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සිතිවිලි වල බලය රැස් කරගෙන උසස් සේවය සඳහා උපකරණයක් වන්න.**

අවසානයේදී, ඔබගේ ප්‍රශ්න පත්‍රයේ එක ප්‍රශ්නයක් තිබෙයි: තත්පරයකදි නැවතීමේ තිතක් තබන්න. ඔබට අංකයක් ලබා දෙන්නේ මෙහි පදනමට අනුවයි. එයට තත්පරයකට වඩා ගත වන්නේ නම්, ඔබ අසමත් වෙයි. සිටිය යුත්තේ එකායන පියා සහ ඔබ පමණයි. අතරමැද තුන්වැන්නෙක් නොසිටිය යුතුයි. එය මෙසේ නොවිය යුතුයි:"මා මෙය කළ යුතුයි. මා මේ ගැන බැලිය යුතුයි. මෙය සිදු වන්නේ ඇයි? සිදුවුනේ කුමක්ද?" ඔබට එවන් සිතිවිලි ඇත්නම්, ඔබ අවසන් ප්‍රශ්න පත්‍රය සමත් නොවෙයි.